ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2116/67 - 2019 මාර්තු මස 29 වැනි සිකුරාදා - 2019.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 3/1/87/2017
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*:
4-3/7/2017/එච්ඩබ්ලිව්/39

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 529 පරගස්වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උදන්විටගමෙහි සර්වේයර් ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 2456, අතිරේක අංක 08 හා 2018.12.21 දිනැති පත්‍ර අංක 09 හි කැබලි අංක 227 - 229 (කැබලි 3 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.7256 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

1. **කැබලි අංක 227**
ඉඩමේ නම: මාකිටන්වත්ත , මාකිටන්වත්තේ කොටසක් , ගයින්නෑවෙල හෙවත් මාවත්තයායඑස්ටේට් ; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නේ සෙයියදු මහම්මදු මහම්මදු සලීම්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0474.

2. **කැබලි අංක 228**
ඉඩමේ නම: මාකිටන්වත්ත , මාකිටන්වත්තේ කොටසක් , ගයින්නෑවෙල හෙවත් පරදළුපොත ; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නේ මැල්සිරිපුර පිහිටි පශු සම්පත් මණ්ඩලය ; ප්‍රමාණය: හෙක්ටයාර් 1.6775

3. **කැබලි අංක 229**
ඉඩමේ නම: උදන්විටකුඹුරුයාය , පරගහදළුපොත හෙවත් පරදළුපොත ; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නේ ඉසුරු නාදයලාගේ ජෝන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0007

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ **2019.05.23** වැනි දින **පෙ. ව. 10.00** ට රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

1A - G 29777 - 23 (2019/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තවද, **2019.05.16** වන දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. පී. ඩබ්ලිව්. ශිරෝමනී,
ප්‍රාදේශීය ලේකම්,
රිදීගම.

2019 මාර්තු මස 27 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-450